














Designed By Niranjan Konthasinghe

# සොබාදහමේ සොඳුරු සටහන
# වනජීවි ඡායාරූපකරණය

සොබා දහමට පෙම් බඳින මිනිසාට ගහකොළ වනාන්තරය සතා සීපාවා යන මේ සියල්ල ම එක්තැන් වූ තැන සෞන්දර්යයේ නවාතැනකි. 'කලාව' යනු විශ්ව භාෂාවක් වනවා සේම ඒ හා සබැඳි සිතුවමක හා ඡායාරූපයක ද රසවත් බව එකසේ විඳ ගන්නට අපට හැකි ය.

**රුක්ෂාන් ජයවර්ධන**



තම විනෝදාංශය වශයෙන් වනජීවි ඡායාරූපකරණයෙහි යෙදෙන රුක්ෂාන් පුරා විද්‍යා ඩිප්ලෝමාධාරියෙකි. එසේම ඇමරිකා එක්සත් ජනපදයේ මේරිලන්ඩ් විශ්ව-විද්‍යාලයෙන් ඔහු සිය පුරාවිද්‍යා උපාධිය හිමිකැර ගත්තේ ය. නිරන්තරයෙන්ම ශ්‍රී ලංකාවේ යාල, විල්පත්තු, කුමන, සිංහරාජ ආදී වනාන්තරවල ගැවසෙමින් සතුන් ගේ චර්යාවන් ග්‍රහණයට ඔහු ගේ තෙවැනි ඇස යුහුසුළු වෙයි.

ආලෝකය මාධ්‍ය කොට ගනිමින් සංවේදී ද්‍රව්‍යමත වස්තූන් ප්‍රතිනිර්මාණය කරන්නා වූ කලාව ඡායාරූප ශිල්පය ලෙස නිර්වචනය කළ හැකි වුවද එය ශිල්පියා තුළ මෙන්ම රසවිඳින්නා තුළ ද උපරිම රස නිෂ්පත්තියක් ඇති කිරීමට

සමත් වේ නම් එහි සැබෑ අරමුණ ඉටු වීමක් විය හැකිය. සොබා දහම තම ආත්මය කොටගත් බොහෝ මිනිසුන්ට එය විචිත්‍රණය කිරීමට කැමරාව සැබෑම කලා මාධ්‍යයක් බව නොකිවමනාය.

ඒ අතරිනුත් සුවිශේෂී ඡායාරූප කලාවක් ලෙස වනජීවී ඡායාරූප කලාව බොහෝ සංවේදී මිනිසුන්ගේ රූප මාධ්‍යයක් ලෙස ජනාදරයට පාත්‍රව ඇති ව පෙනේ. කුඩා වියේ සිට ම සතා සීපාවට කුරුල්ලන්ට ඇල්මක් ආශාවක් දක්වන්නට වූ ඔහු තුළ තිබූ නිසඟ ප්‍රතිභාව ඔපවත් වන්නට විය. ඔහු ගේ විනෝදාංශය වූයේ වන සතුන් හා පරිසරයේ ජීවත්වන කුරුල්ලන් ගේ චර්යාවන් නිරීක්ෂණය කරමින් ඡායාරූප ගත කිරීමයි. ඔහු රුක්ෂාන් ජයවර්ධනය.

"සැබැවින්ම මේවනතුරුත් මගේ අතින් මිනිස් රූපයක් ඡායාරූපයකට නැඟිලා නැති තරම්. ඒ තරමටම මගේ බැඳීම තියෙන්නේ වනාන්තරයත්, සතුනුත් සමඟ යි. සතුන් ගේ ඡායාරූප ගන්නට පෙර සතුන් ගැන හොඳ අධ්‍යයනයක් කර ඒ ගැන හොඳ දැනුමක් ලබාගත යුතුයි. සතුන් ගේ හැසිරීම උන් වනය තුළ සැරිසරන වේලාවන් ආහාරයට ගොදුරු සොයා යන වේලාවන් වැඩි වශයෙන් ගැවසෙන ස්ථාන ආදිය පිළිබඳ නිරීක්ෂණය කොට වැටහීමක් ලබා තිබිය යුතුයි. සතුන් ගැන හොඳ වැටහීමක් නොමැතිව හොඳ ඡායාරූප නිර්මාණය කරන්නට අමාරුයි. එවිට හොඳ ඡායාරූපයක් බිහිවන්නට ඇති ඉඩකඩ වැඩියි. මේ බව නොදැන සතකු දුටු පමණින් ම ඡායාරූපයක් ගත්විට එහි සාර්ථකත්වය අඩුයි. එවිට බොහෝ අඩුපාඩු දැකිය හැකියි. වනසතුන්ගේ රුව කැමරාවට හසුකර ගැනීමේ දී ඡායාරූප ශිල්පියා තුළ මනා සංයමයක් තිබීම අවශ්‍යයි.

එසේ වුවත් වේගවත් ඉක්මන් බවකුත් තිබිය යුතුමයි. එහෙත් අනවශ්‍ය කලබලකාරී බවක් ඉන් අදහස් වන්නේ නැහැ. ඡායාරූපයක් ගැනීමට මුලින්ම තීරණය කළ යුතු පසුබිමක් මෙහිදී තිබෙන්නට බැහැ. ඒ කුමක් නිසා ද කියනවානම් කැලයේ සැරිසරන විට එක්වරම හමුවන සතකුගේ රුවක් එසැණින් ඡායාරූපයට නැඟීමට අපට සිදුවනවා.


එමනිසා සතාගේ ඉරියව් හා හැසිරීම මේ ආකාරයෙන් තිබිය යුතුය කියා තීරණය කළ නොහැකියි. සතුන් ගේ ඉරියව් හා හැසිරීම් කැමරාවට හසුකර ගැනීමට හොඳම කාලය වන්නේ අලුයම් කාලයත් සවස ගොම්මන් අඳුරු කාලයයි. සතුන් කැලයෙන් එළියට ඇදෙන වේලාව මෙය නිසා එය ඡායාරූප ශිල්පියාට හොඳ අවස්ථාවක්. මෙම වෘත්තියෙහි කීර්තිමත් නමක් හදා ගැනීමට මෙන්ම වෘත්තීය ඡායාරූප ශිල්පියකු වන්නට නම් බොහෝ දේ කැප කළ යුතුයි. ඇතැම් විට හද්දා වනාන්තරයේ දින ගණන් නැවැතී සිටින්නට සිදුවන්නේ ඡායාරූප ගැනීමට ඇති පිපාසාව නිසාමය.


එහෙත් ඇතැම් විට අප ඉලක්ක කොටගත් ඡායාරූප ගැනීමට දුර බැහැර වනාන්තරවලට ම යායුතු නැහැ. අප අවට පරිසරයෙන් එවැනි සුන්දර දසුනක් කැමරාවට හසුකර ගන්නට අපහසු නැහැ. ඇතැම්විට අප සිතුවාටත් වඩා අගනා කලාත්මක ඡායාරූපයක් මෙවැනි අවස්ථාවක ලබාගන්නට අපට පුළුවන්. සැමවිටම තමන් ගේ ඇස්මට්ටමේ පෙනෙන පරිදි ඡායාරූප ගැනීම කළ යුතුයි."

ඔහු සඳහන් කළ පරිදි වරක් කොළඹින් පිට චාරිකාවක දී යෙදී සිටියදී පලාකොට්ටෝරුවෙකු ගේ ඡායාරූපයක් කැමරාවට ග්‍රහණය කර ගැනීමට ඔහු බොහෝ වෙහෙසක් ගත්තේ ය. ඒ හැමවිටම, කැමරාව ක්‍රියාත්මක කරද්දී ම ඌ ඉගිළ ගියෙන් ඔහුගේ වෑයම ව්‍යර්ථ විය. දිනක් උදෑසන ඔහු තම නිවෙසේ ජනේලයෙන් එළිය බලා සිටිය දී කොට්ටෝරුවෙක් කිතුල් ගසක වසා සිටින අයුරු දුටුවේය. එසැණින් ඔහු ගේ කැමරාව ඉස්සර විය. එය අද ඔහු ගේ ඡායාරූප අතර සුරැකිව ඇති හොඳම සේයා රුවකි. ඔහු පවසන ආකාරයට වනජීවී ඡායාරූපකරණයට නැඹුරුවන ඇල්මක් දක්වන ඒ සඳහා ප්‍රවිෂ්ට වන ආධුනිකයකු , එතෙර දැනුම ලබා ගැනීම අනිවාර්යයෙන් ම කළ යුත්තකි.

"එතෙර දැනුම අවශ්‍ය වුවත්, එහි ප්‍රායෝගික අංශය අධ්‍යයනය කිරීමට ශ්‍රී ලංකාව කදිම තෝතැන්නක් බව අමතක කළ යුතු නැහැ.

ශ්‍රී ලංකාව වැනි ජෛව විවිධත්වයක් ඇති වනාන්තරවලින් ග්‍රහණ රටක ඕනෑ තරම් සම්පත් තිබෙනවා. ලංකාව කුඩා බිම් ප්‍රමාණයකින් යුත් රටක් නිසා කෙටිදුර ප්‍රමාණයකින් විශාල ප්‍රදේශයක් එක්වර ආවරණය කර ගැනීමේ හැකියාව තිබෙනවා. අප්‍රිකාව වැනි රටක් ගතහොත් එහි බිම් ප්‍රමාණය විශාල යි. කෙන්යාව වැනි තවත් බොහෝ අප්‍රිකානු රටවල වැසියන් ස්වාභාවික පරිසරයට වන සතුන්ට දක්වන්නේ දැඩි ආදරයක්. ඒ නිසා වනජීවී විෂයට එවැනි රටවල අනුග්‍රහය වැඩියෙන් ලබන්නට හැකියාව තිබෙනවා.









Designed By Niranjan Kontmasinghe

ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර බොහොමයක් පවතින්නේ වියළි කලාපය ආසන්නයේ යි. තෙත් කලාපයේ පවතින්නේ 3% කටක් අඩු ප්‍රමාණයක්. එයට හේතුව, තෙත් කලාපය පුරා ජනගහණ ව්‍යාප්තිය වැඩිවීම නිසා කැලෑ එළිපෙහෙළි වීම යි. මෙය ජෛව විවිධත්වයට තදබල පහරක් ලෙස පෙනී යනවා. සතුන් ගේ පැවැත්මට ද මෙය විශාල බාධාවක්.

මෙම රක්ෂිත වනාන්තර අවට ජීවත්වන බොහෝ දෙනා සතුන් දඩයම් කිරීම නිසා, ඇතැම් සතුන් වඳ වී යාමේ තර්ජනයට ලක්වෙමින් පවතිනවා. වනජීවී ඡායාරූපකරණයට පිවිසෙනවා නම් සතුන්ට ආදරය කිරීම ද අවශ්‍ය යි. මේ ආකාරයට වඳවෙමින් යාමේ තර්ජනයට ලක් වන ශ්‍රී ලංකාවේ දිවියා ගේ ඉරණම ද අවදානමක පවතින බව පෙනී යනවා."

ශ්‍රී ලංකාවේ දිවියන් ගැන පර්යේෂණ පවත්වා ඔහු විසින් සම්පාදිත "For the lepoards" නම් ග්‍රන්ථය වනදිවි අසිරියේ රසමුසු තැන් කියාපාන්නකි.

"මා ඡායාරූපකරණයට යොමු වුණේ වෘත්තීමය ඡායාරූප ශිල්පියකු වීමට නොවෙයි. වන සතුනට කැලෑවට මා තුළ දැඩි ඇල්මක් තිබුණා. එහෙත්, අපේ රටේ ඇති මෙවැනි සම්පත්වලට කිසියම් අගයක් ලබාදීමත් ඒවාට විදේශ රටවලින් යම් ඇගයීමක් ලබාදීමත් තමයි මගේ අරමුණු වුණේ. තවත් අතකින් එය මගේ විනෝදාංශය ලෙස මා ආශාවෙන් කරන දෙයක්."

වෘත්තීමය වශයෙන් වනජීවී ඡායාරූප ශිල්පියකු ලෙස මෙම ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වන කෙනකු ඒ සඳහා අවශ්‍යකරන කැමරා මෙවලම් ආදිය සපයා ගැනීම කළ යුතුයි. එහෙත් ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම මේ සඳහා ඇති ගැටලුවක්. විනෝදාංශය සඳහා නම් එසේ වැය කළ යුතු නැහැ. මේ සඳහා යොමුවන අය මනා ඉවසීමක් ප්‍රගුණ කළ යුතුයි.

වනජීවී ඡායාරූපකරණයේ දී භාවිත කරන උපකරණ ගැන සඳහන් කළොත්, අනෙක් සියලුම දේට වාගේම මේ සඳහාත් "ඩිජිටල් කැමරා" යොදා ගැනීම තමයි වඩාත් හොඳ. නෙගටිව්වලට වඩා ඩිජිටල් කැමරා ඉදිරියෙන් සිටිනවා. වැරදුනත් නැවත නැවත අරගෙන හොඳ ඡායාරූපය තෝරාගන්න පුළුවන්".


කාලයත් ඉතිරිවෙනවා. සතුන් ගේ ඉරියව් නිමේෂයක දී වෙනස් වෙනවා. සේයා පටල මාරු කරන්නේ නැතිව ඡායාරූප ගැනීමේ හැකියාව ඒ මඟින් ලැබෙනවා. තාක්ෂණයේ දියුණුවත් අද මෙයට හොඳ ආශිර්වාදයක් සේයා පටලවලට යන විශාල වියදමත් ඉතිරිවෙනවා.පටල පටිවලින් (සේයාපටල) මේ දේවල් කරන්න අමාරුයි. අතර මඟදී පටල පටි ඉවර වුණොත් එයත් වනාන්තරයේ සවාරියට බාධාවක්. අනෙක පටල පටි නිසා ගත හැකි රාමු ගණන සීමාසහිතයි. ඩිජිටල් කැමරාවල ඇති අසීමිත පහසුකම් නිසා වඩාත් පහසුයි. චිප් එක පිරුනහම එහි දත්ත ගබඩාවට දාගන්න පුළුවන්. වනයේ සංචාරය කරද්දී 'බීන් බෑග්" එකක් ඔළිඳ, මදටිය වැනි ඇට වර්ග පිරවු කුඩා කොට්ටයක් ට්‍රයිපෝඩ් එකක් (ත්‍රිපාද පීඨයක්) රැගෙන යාම කළ යුතුයි. වාහනයේ සිටම ඡයාරූප ගැනීමේදී කැමරාව නොසෙල් වී තබා ගැනීමට මෙම 'බීන් බෑග්' එක අප භාවිත කරනවා. "

සැමවිටම කම්පනය හා චලනය අවම කරන VR Lence එකක් භාවිත කිරීම කළ යුතුය. කෙසේ වූවද මේ සියල්ල යහපත් ආලෝක තත්ත්වයන් යටතේ ග්‍රහණය කරගත යුතුය. කුඩා සතුන්, කුරුල්ලන් වැනි සතුන් ගේ ඡායාරූප ගැනීම සඳහා "මැක්රෝ ලෙන්සස්" භාවිත කිරීම සුදුසු මෙන්ම, සතුන් ඡායාරූප ගැනීමේ දී අඩුම තරමේ කැමරා දෙකක් හෝ එයට වැඩි ගණනක් තබා ගැනීම සුදුසු ය.

කුරුල්ලන්ගේ ඡායාරූප ගැනීමේ දී මි.මී. 500 කාචයක පටල වේගය 1.5 න් වැඩිවීම නිසා මි.මී.750 කාචයක් බවටපත් වෙනවා. ඩිජිටල් ප්‍රතිබිම්බවල මෙය අපට ඇති වාසියක්. විශේෂයෙන් ම සතුන් ගේ ඡායාරූප ගතකිරීම්වල දී කාච මාරු කර කර ඉන්න වේලාවක් නැති නිසා කාච සවි කරන ලද කැමරා රැගෙන යාමත් එක් අතකින් පහසුවක්. තියුණු බව වැඩි නිසා දුර රූප කාච භාවිත කළ හැකිය. කාචයේ නාභි දුර වැඩිවෙත්ම ඡායාරූප ගැනීමට ලැබෙන අවස්ථාව අඩුයි. එසේම මි.මී 200 මි.මී 300 වැනි දුර රූප කාච භාවිත කිරීමෙන් පර්යාවලෝකන පාලනය කරමින් දුරස්ථව ඇති වස්තූන් සමීපව දැක්විය හැකිය. මෙම සෞන්දර්යවාදී ඡායාරූප ශිල්පියා ගේ අපේක්ෂාව වන්නේ, වනපෙත පුරා ඔහු ගේ ඇස ගිය තැන් ග්‍රහණය කරමින් එතෙර ප්‍රදර්ශන හා තරගවලට ඉදිරිපත් කිරීමෙන් අපේ රටේ කීර්තියට රැකුල් දීමයි. එවැනි දෙයින් ඔහු බොහෝ වර මව්බිමට කීර්තියක් අත්කර දුන්නේ ය. ඇමරිකාවේ මේරිලන්ඩ් විශ්වවිද්‍යාලයයේ පුරාවිද්‍යා උපාධිධාරියෙක් වූ ඔහු පුරා විද්‍යාව හදාරා හසළ දැනුමකින් ද සන්නද්ධ හෙයින් අපේ පැරණි ඉතිහාසය වාරිමාර්ග ක්‍රමයන්හි අභිමානය හඳුන්වා දෙන්නට ද වෙර දරයි.

හෝර්ටන් තැන්න, ඉතා අලංකාර ශාක මෙන්ම ජෛව විවිධත්වය ඉතා ඉහළින් දැකිය හැකි ප්‍රදේශයකි. යාල විල්පත්තු කුමන වැනි පාරිසරික වනාන්තර තුළ දී අපට දැකිය හැකි සතුන් ප්‍රමාණය ද අති විශාලය.

මහ වනය තුළදී කැමරා ශිල්පීන්හට කිසියම් අවදානමක් දැරීමට ද සිදු වේ. බොහෝ කලකට පෙර, විදේශිකයකු වූ, ජාත්‍යන්තර මට්ටමේ වනජීවී කැමරා ශිල්පී "එරික් සෝන්" ඡායාරූප ගනිමින් සිටිය දී අලියකු ගේ ප්‍රහාරයට ලක්ව මරුමුවට පත් විය. ඔහු මිය ගිය ස්ථානය "එරික්සෝන් ගල" නමින් තවමත් පොළොන්නරුව ප්‍රදේශයේ දක්නට ඇත. එසේ වූවද රැක්ෂාන් පවසන්නේ එකම එක වතාවක් පමණක් තම වාහනය අලි ප්‍රහාරයට ලක්වූ බවය. සතුනට ආදරය කිරීමත්, උන් ගේ චර්යාවන් අධ්‍යයනය කිරීමත්, වනාන්තරය පිළිබඳ අධ්‍යයනයක් ඇතිව ඒ සඳහා යොමුවීමක් මඟින් එවැනි ප්‍රශ්න ඇති නොවන බව ඔහු ගේ අදහසයි.









Designed By Niranjan Konthasinghe

**නන්දි අලුත්ගේ රත්නවීර**